(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 3(6).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 ජූනි මස 24 වැනි සිකුරාදා

## 2011 ජූලි මස 05 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1047/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දිවයිනේ විවිධ පළාත්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීම සම්බන්ධයෙන් 2006.10.25 දින අමාත්‍ය මණ්ඩලය එළැඹි තීන්දුවකට අනුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47උප හා 2007.02.10 දිනැති උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අයදුම්පත් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව මධ්‍යම පළාත තුළ ගුරු සහායක තනතුර සඳහා අයදුම්කළ සංඛ්‍යාව කොපමණද;

(ii) සම්මුඛ පරීක්ෂණයෙන් එම තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන් අතරින් මේ වන විටත් ඉහත පත්වීම් ලද පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවලට අයත් අධ්‍යාපන කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1144/'11

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් අතරින්,

(i) තුවාල ලැබූ (විවිධ අනතුරුවලට භාජනය වූ) සංඛ්‍යාව;

(ii) රැකියා අහිමිව ආපසු පැමිණි සංඛ්‍යාව;

(iii) සුභ සාධක මධ්‍යස්ථානවල සිටින සංඛ්‍යාව;

(iv) වර්ෂ 2005 දී මියගිය සංඛ්‍යාව;

කවරේද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) කොටසෙහි සඳහන් පීඩාවන්ට පත්වූවන් සඳහා රජය කිසියම් සහන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, ඔවුන් වෙනුවෙන් දුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1164/'11

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පන්ති තහනමට ලක්වූ සිසු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසු/සිසුවියන්ගේ නම් සහ ඔවුන් පන්ති තහනමට ලක් කෙරුනු චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතරින් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව කවරේද;

(iv) පන්ති තහනමට ලක්වූ අනෙකුත් සිසුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1177/'11

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකරණ කාර්යාලයේ සහයෝගය ඇතිව නීති පීඨය සහ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය විසින් 2010 දෙසැම්බර් 10 දින කොළඹ විශ්වවිද්‍යාලයෙහි සංවිධානය කළ උත්සවයකදී 1998 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මානලාභියෙකු වන සුනිලා අබේසේකර මහත්මියට කතාකිරීමට අවසර ලබා නොදුන් බවත්;

(ii) සුනිලා අබේසේකර මහත්මියට කතාකිරීමට අවසරදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය එම උත්සවය අවලංගු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කී උත්සවයේදී සුනිලා අබේසේකර මහත්මියට කථාකිරීමට ඉඩ නොදීමට හේතු කවරේද;

(ii) විශ්වවිද්‍යාලයක කථාකිරීමට හැක්කේ කාටද යන්න නිශ්චය කිරීම සඳහා ප්‍රතිපත්තියක් තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිපත්තිය කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සිතීමේ නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අවශ්‍ය කරන්නා වූ විශ්ව මට්ටමේ ඉගෙනුම හා දැනුම විශ්වවිද්‍යාල තුළ ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1048/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල, විල්ගමුව, ගලේවෙල හා මාතලේ යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 31 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1149/'11

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලියාපදිංචි කිරීම සඳහා රජය අය කරන ලද ගාස්තුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විවිධ අක්‍රමිකතා සඳහා යොමු වී ඇති විදේශ රැකියා නියෝජිත ආයතන තිබේද;

(ii) ඒවා නීතිය හමුවට ගෙනැවිත් තිබේද;

(iii) එවැනි ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1049/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, නුවරඑළිය, හඟුරන්කෙත, කොත්මලේ හා හැටන් යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 50 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේනම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 103— වැඩසටහන 1,—† 2011 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් බිලියන විස්සකට (රු. 20,000,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතුවන අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතු ය.

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 103 - | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 1 - | මෙහෙයුම් වැඩසටහන | | |
| ව්‍යාපෘතිය | 2 - | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | | |
| | | ප්‍රාග්ධන වියදම | රු. | 20,000,000,000 |
| | | **මුළු වියදම** | **රු.** | **20,000,000,000** |

(රුපියල් බිලියන විස්සක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2011 ජූනි මස 23 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*

අධිකරණ අමාත්‍යතුමා,— ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග,— (81 වැනි අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී ආඥාපනතේ 6 සහ 10 වැනි වගන්ති යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ, 2011.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

---

## 2011 ජූලි මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0687/'10

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සමස්ත විදුලිබල උත්පාදනය සහ එම ප්‍රමාණයෙන් ජල විදුලිබල හා තාප විදුලිබල උත්පාදන ප්‍රතිශතයන් කවරේද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය සහ පුද්ගලික අංශය විසින් උත්පාදනය කරනු ලබන තාප විදුලිබල ප්‍රමාණය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්‍රමක්ෂය, පොළී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම් ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි නිෂ්පාදන පිරිවැය කවරේද;

(ii) උත්පාදනය කරනු ලබන තාප විදුලිබල ඒකකයක මිල සහ පුද්ගලික අංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට එම මිලට තාප විදුලිබලය සැපයීම සඳහා ගිවිසුම් ගත කාල සීමාව කවරේද;

(iii) තාප විදුලිබලය මිලදී ගැනීමට අදාළ ගිවිසුම්වල ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් කිසියම් වගන්තියක් තිබේද;

(iv) සූර්ය බලය හා සුළං බලය පදනම් කරගෙන විදුලිය උත්පාදනය කිරීමට සම්බන්ධ කිසියම් සංවර්ධන වැඩසටහනක් තිබේද;

(v) එවැන්නක් නොමැති නම්, එකී පුනර්ජනනීය ශක්ති ප්‍රභව විදුලිය උත්පාදනය සඳහා භාවිතා නොකිරීමට හේතු කවරේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අංශය විසින් උත්පාදනය කිරීමේදී;

(ii) පුද්ගලික අංශයෙන් මිලදී ගැනීමේදී;

(iii) ව්‍යාපාරික අංශයට සහ ගෘහස්ත පාරිභෝගිකයන්ට විකිණීමේදී;

විදුලි ඒකකයක සාමාන්‍ය මිල කවරේද යන්න යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0984/'10

ගරු දයාසිරි ජයසේකර මහතා ,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විල්පත්තු අභය භූමිය තුළ වැලි ගොඩ දැමීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති අවසර පත්‍රය ඉදිරිපත් කරන්නේද;

(iii) එම බලපත්‍රය ලබා දුන් බලධාරියා කවරුන්ද;

(iv) එම බලපත්‍රය මගින් වැලි ඉවත් කිරීමට අවසර ලැබී ඇති පුද්ගලයා හෝ පුද්ගලයින් කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අභය භූමියෙන් මේ වන විට ඉවත් කර ඇති වැලි ප්‍රමාණය කොපමණද;

(ii) එම වැලි කවර කටයුත්තක් සඳහා රැගෙන යනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1050/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මහනුවර දිස්ත්‍රික්කයේ කටුගස්තොට, ගම්පොල, තෙල්දෙනිය, වත්තේගම, දෙනුවර සහ මහනුවර යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 61 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1166/'11

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ පොහොර සහනාධාර වැඩ පිළිවෙළ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොහොර තොග බෙදුම්කරු ලෙස කෘෂිකාර්මික ගොවිජන වගාකරුවන්ගේ සංවිධානය ක්‍රියා කරන්නේද;

(ii) එම සංවිධානය පොහොර බෙදා හැරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2006 සිට 2010 දක්වා වාර්ෂිකව ඉහත තොග බෙදුම්කරු වෙත සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් නිකුත් කළ එක් එක් පොහොර වර්ග තොග ප්‍රමාණය කවරේද;

(ii) වර්ෂ 2009 වන විට එම තොග බෙදුම්කරු විසින් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට බෙදාහරින ලද එක් එක් පොහොර වර්ග ප්‍රමාණයන් කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම බෙදුම්කරුට ලැබුණු පොහොර ප්‍රමාණය හා බෙදා හරින ලද ප්‍රමාණය අතර සංසන්දනයට අනුව තොග ඌනතාවයක් පවතින්නේ නම්, ඒ කොපමණද;

(ii) පොහොර මෙට්‍රික් ටොන් එකක වෙළඳපොළ වටිනාකම අනුව එම ඌන තොගවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත තත්ත්වය හේතුවෙන් රජයට හා ගොවි ජනතාවට පාඩුවක් සිදුවී ඇති බවත්;

(ii) අදාළ බෙදුම්කරු විසින් වංචාවක් සිදුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1212/'11

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටුවා ඇති රජයේ මධ්‍යම බෙහෙත් ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) අලුතින් මධ්‍යම බෙහෙත් ශාලා ඉදිකරගෙන යනු ලබන ස්ථාන කවරේද;

(iv) දැනට පවතින හා අලුතින් ඉදිකරගෙන යනු ලබන මධ්‍යම බෙහෙත් ශාලාවලට අමතරව රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින අවශ්‍යතාව සපුරාලීමට ස්ථාපනය කළ යුතු මධ්‍යම බෙහෙත් ශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මධ්‍යම බෙහෙත් ශාලාවක් ස්ථාපනය කිරීමේදී අමාත්‍යාංශය මගින් සැලකිල්ලට ගනු ලබන නිර්ණායකයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1215/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනාධිපති අරමුදලට මුදල් ආධාර ලැබෙන ආකාරය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008, 2009 සහ 2010 වර්ෂයන්හිදී, වෙන් වෙන් වශයෙන්,

(i) ජනාධිපති අරමුදලට වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එම අරමුදලින් ලබාදුන් ආධාරවල එකතුව කොපමණද;

(iii) ජනාධිපති අරමුදලින් ආධාර ලබා දෙන ක්ෂේත්‍ර හා එක් එක් ක්ෂේත්‍රය වෙනුවෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(iv) ආධාර ලබා දුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1302/'11

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා බැංකුව සතු අංක 65 - 1990, 32 - 7394, 32 - 7393 සහ 65 - 1986 දරන වාහන හතර එක් වාහනයකට මාසිකව රු. 25000/- බැගින් වූ කුලී පදනම යටතේ මුදල් අමාත්‍යාංශයට ලබාදී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වාහනවලට අදාළ කුලී මුදල් 2009.10.09 දින සිට මේ දක්වා මුදල් අමාත්‍යාංශය විසින් ලංකා බැංකුවට ලබා දී තිබේද;

(ii) අනතුරට පත්වී ඇති අංක 65 - 1986 දරන වාහනය වෙනුවෙන් වන්දි මුදල් ලංකා බැංකුවට ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන්කරන්නෙහිද?

(ඇ) (i) අංක 65 - 1990 සහ 32 - 7393 දරන වාහන දෙක ආපසු ලංකා බැංකුවට භාරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1213/'11

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ඇති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල සේවය කරනු ලබන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) සාමාන්‍යයෙන් එක් වර්ෂයකදී පෙර පාසැල් අධ්‍යාපනයට ඇතුළත් වන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකාවේ පෙර පාසල් හා පෙර පාසල් ගුරුවරුන් ලියාපදිංචි කිරීම සඳහා සම්මත ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) පෙර පාසල් ගුරු පුහුණුව සඳහා අනුමත, ජාතික මට්ටමේ පුහුණු පාඨමාලාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1303/'11

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික උරුමයක් වශයෙන් නම්කර ඇති යෝර්ක් වීදියේ ලංකා බැංකු ගොඩනැගිල්ල හෝටල් කළමනාකාර සමාගමක් වෙත බදුදීමට තීරණය කර තිබේද;

(ii) එම ගොඩනැගිල්ලේ පිහිටා ඇති ලංකා බැංකුවේ අගනුවර ශාඛාව සහ වෙනත් බැංකු අංශ එයින් ඉවත් කරන්නේද;

(iii) දැනට යෝර්ක් වීදිය ලංකා බැංකු ගොඩනැගිල්ලේ පිහිටා ඇති එම බැංකුවට අයත් ජී. ඕ. එච්. හෝටලය අලාභ තත්ත්වයෙන් පවත්වාගෙන යන්නේද;

(iv) එම තත්ත්වය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1216/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1304/'11

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 ජනවාරි මස 02 වැනි දින සිට 2010 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ ලංකා බැංකුවට බඳවා ගෙන ඇති උපදේශකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ උපදේශකයින් බඳවා ගැනීමට මුදල් අමාත්‍යාංශයේ අනුමතිය ලබාගෙන තිබේද;

(iii) උපදේශක තනතුර සඳහා අදාළ බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

(iv) උපදේශක තනතුර සඳහා බඳවා ගත් අයෙකුට ගෙවන මාසික වැටුප්, දීමනා හා වෙනත් පහසුකම් කවරේද;

(v) ඉහත පරිදි බඳවාගෙන ඇති උපදේශකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0905/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වසර පහකට අධික කාලයක් නැගෙනහිර පළාතේ කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවයකරමින් සිටි ඉංග්‍රීසි ගුරුවරුන් පිරිසක් සඳහා අදියර දෙකකින් (රා.ප. චක්‍රලේඛ අංක 13/2005 සහ 21/2006 යටතේ) ස්ථිර පත්වීම් පිරිනමන ලද බවත්;

(ii) ඉහත රා.ප. චක්‍රලේඛවලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ED/2/29/4/1/46 හා 2005/7/19 දිනැති ලිපියේ සඳහන් උපදෙස් පරිදි, 2005/7/28 දින සිට ඉහත ගුරු පිරිසෙන් කොටසකට පත්වීම් ලබාදී ඇති නමුත්, 2003 - 2004 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවය කරන 50 දෙනෙකු පමණ වූ ගුරු පිරිසකට මේ දක්වා ස්ථිර පත්වීම් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර, අක්කරපත්තුව සහ සම්මන්තුරේ යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීමටත්;

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ පඩ්ඩිරිප්පු, කල්කුඩා සහ මඩකලපු යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබාදීමටත්;

නොපමාව පියවර ගන්නේද, යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1174/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයිනේ ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන සියල්ල මේ වන විට ලේඛනගත කර තිබේද;

(ii) එම ස්ථාන බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා වෙනත් ආගමික ස්ථාන වශයෙන් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1214/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ සිටින වැන්දඹු කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු හා නැගෙනහිර පළාත් හැර අනෙකුත් පළාත්වල යුද්ධය හේතුවෙන් වැන්දඹුවූ කාන්තාවන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සමස්ත වැන්දඹු කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1347/'11

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් දැනට රට තුළ සේවය කරන ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන් අතරින් පළාත් රාජ්‍ය සේවය තුළ හා මධ්‍යම රජය යටතේ සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සමස්ත අධ්‍යාපන පද්ධතියට අවශ්‍ය ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දැනට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ගේ හිඟය නැති කිරීම සඳහා දියත් කෙරෙන වැඩපිළිවෙළ කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1175/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු නැගෙනහිර පළාත්වල ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන නිදන් හොරුන් විසින් විනාශ කරන බව එතුමා දන්නෙහිද?

(ආ) එම ස්ථාන නිදන් හොරුන්ගෙන් සහ අනෙකුත් ආපදාවලින් රැක ගැනීමට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1201/'11

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2004 සුනාමි ව්‍යසනයේදී සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විනාශයට පත් වූ නිවාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුනාමියෙන් හානියට පත්වූවන්ගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස 460ක අවශ්‍යතාවයක් තවමත් පවතින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 7කට ආසන්න කාලයක් තිස්සේ තවමත් අවතැන් කඳවුරුවල සිටින සුනාමියෙන් විපතට පත් පුද්ගලයන් හට උපකාරවනු පිණිස ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) සුනාමියෙන් විපතට පත් පුද්ගලයන්ගේ නිවාස අවශ්‍යතා සපුරා අවසන් කිරීම සඳහා නියම කළ හැකි අවසන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1348/'11

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවති ත්‍රස්තවාදය අවසන් වීමෙන් පසුව මෙරටට විදේශ සංචාරකයින් පැමිණීමේ ප්‍රවණතාව වැඩිවී තිබේද;

(ii) පෙර වර්ෂයන්ට සාපේක්ෂව 2010 වර්ෂයේදී සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනය කොපමණද;

(iii) වර්ෂ 2011 මුල් කාර්තුවේදී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ එහි සාපේක්ෂ වර්ධනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදෙස් සංචාරකයින් මෙරටට ගෙන්වා ගැනීමට ගෙන ඇති නව ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ වන විට ඒවා ක්‍රියාත්මක කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1176/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෝට්ටේ ජාතික සේවක සංගමයේ මූලස්ථානය පවත්වාගෙන යන භූමිය පුරාවිද්‍යාත්මකව වැදගත් ස්ථානයක් බවත්;

(ii) එම භූමිය තුළ කෝට්ටේ රාජධානියට අයත් පුරාවිද්‍යාත්මක ස්මාරක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම වටිනා පුරාවිද්‍යා භූමිය නිදහස් කර ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1345/'11

ගරු එම්. ටී. හසන් අලි මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හදිසි අනතුරකින් දෙපයට සිදුවූ හානි හේතුවෙන් ස්ථිර ආබාධිත තත්ත්වයට පත්ව, දැනට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිව අසීරුව දිවි ගෙවන අකුරැස්ස, ගොඩපිටිය, ගොඩවත්තේ පදිංචි තිදරු පියෙකු වන එම්. එස්. එම්. පස්ලි මහතා විසින් මාසිකව රු.3000ක මූල්‍යාධාරයක් ලබාදෙන ලෙස අතුරලිය ප්‍රාදේශීය ලේකම් වෙත 2010.09.08 දිනැතිව ලිඛිත ඉල්ලීමක් කර ඇතත් මෙතෙක් ඒ මහතාට කිසිදු සහනයක් ලැබී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) ස්ථිර ආබාධිත තත්ත්වයට පත්ව ඇති පස්ලි මහතාට මාසිකව රු. 3000/= ක මූල්‍යාධාරයක් 2011 ජනවාරි මාසයේ සිට ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1349/'11

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් සේවය කරන බවත්;

(ii) එම නිලධාරීන්ගේ සේවය තුළින් ජාතික ආර්ථිකයට විශාල ශක්තියක් ලැබෙන බවත්;

(iii) සමහර ප්‍රදේශවල සේවය සඳහා එම නිලධාරීන් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට සේවයේ යෙදී සිටින සිටින කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ දැනට පවතින හිඟය පිරවීම සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූලි මස 08 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0860/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පාසල් සිසුන්ට ආහාර සැපයීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන්නේද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම්, දිස්ත්‍රික්ක සහ අධ්‍යාපන කලාප මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් ලබාදෙන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) මෙම වැඩසටහන අනුව එක් සිසුවෙකුට දිනකට වෙන්කරනු ලබන මුදල හා ලබාදෙන ආහාර වේල කවරේද;

(v) මෙම වැඩසටහන පාසල් මට්ටමින් ක්‍රියාත්මකවන ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන යටතේ පාසල් සඳහා ආහාර සපයන අධ්‍යාපන කලාප ගණනාවකම ආහාර සැපයුම්කරුවන්ට නියමිත පරිදි මුදල් ගෙවා නොමැති බවත්;

(ii) ආහාර සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව ඇති බවත් හා එමගින් පාසල් සිසුන්ට ආහාර ලබාදීමේ වැඩසටහනට බාධා වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ආහාර සැපයුම්කරුවන්ට අවසාන වරට මුදල් ගෙවා ඇති මාසය කවරේද;

(ii) මේ වනවිට ඔවුන්ට ගෙවා ඇති හිඟ මුදල ඒ ඒ දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යෑමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0977/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන ඇති පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1045/'10

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව හෙවත් ස.තො.ස. පෞද්ගලීකරණය කරන ලද දිනය කවරේද;

(ii) එවකට පැවති රජය කවරේද;

(iii) එම රජයේ ස.තො.ස. අදාළ විෂය භාර අමාත්‍යවරයා කවුරුන්ද;

(iv) ස.තො.ස. පෞද්ගලීකරණයෙන් රජයට සිදු වූ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පෞද්ගලීකරණය කරනු ලැබූ ස.තො.ස. නැවත රජයට පවරාගත් දිනය කවරේද;

(ii) එවකට පැවති රජය කවරේද;

(iii) ස.තො.ස නැවත රජයට පවරාගත් වකවානුවේ සිටි අදාළ විෂය භාර අමාත්‍යවරයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1150/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහා විද්‍යාලයෙහි 2010 වර්ෂයේදී ගුරුවරුන් 68 දෙනෙකු සේවය කළ බවත්;

(ii) වර්ෂ අටක් එකම පාසලෙහි සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරුකිරීමේ ගුරු ස්ථානමාරු ප්‍රතිපත්තිය යටතේ එම පාසලේ ගුරුවරුන් 30 දෙනෙකු ස්ථාන මාරු ලද බවත්;

(iii) අලුතින් ස්ථාන මාරු ලැබූ ගුරුවරුන් හත් දෙනෙකු පාසලට පත්කොට ඇති බවත්;

(iv) 1500 කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන මෙම පාසලට ගුරුවරුන් 72 දෙනෙකු අවශ්‍ය වෙතත්, දැනට ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන්ගේ සංඛ්‍යාව 42 ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහා විද්‍යාලයේ පවතින එම ගුරු හිඟය මඟහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'11

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1980 සිට 2011 පෙබරවාරි මාසය දක්වා රජයේ සේවකයින් සංඛ්‍යාව වැඩිවී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාල සීමාව තුළ ජීවන වියදම් දර්ශකය වැඩි වී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0874/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලංකාව ඉරානයෙන් ලබා ගත් ණය ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී ඉරානය හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවලින් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන අරමුදල යන ආයතනවලින් ලබා ගත් ණය මුදල් යෙදවූ ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා යෙදවූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ණය මුදල්වලින් ව්‍යාපෘති සඳහා නොයෙදවූ දැනට භාණ්ඩාගාරය සතුව ඇති ප්‍රමාණය කොපමණද;

(v) ඉහත (ii) හි සඳහන් එක් එක් ආයතනයට හෝ රටට ගෙවීමට ඇති ණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ණය ප්‍රමාණයන් ගෙවීමට දී ඇති කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.126/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" ස්ථාපනය කිරීම,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා වන දස අවුරුදු ජාතික සැලැස්මක් ඇති කිරීම ජාතික ඒකාබද්ධතාව සහ සමාජ සංහිඳියාව සඳහා ඉතා වැදගත් ක්‍රියා මාර්ගයක් බැවින්, කෙටි කාලීන නිරාවරණ වැඩ සටහන් යටතේ ශිෂ්‍යයන් සහ ගුරුවරුන් හුවමාරුව සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" මගින් බහුතරයක් සිංහල භාෂාව කථා කරන ප්‍රදේශවල තිබෙන එක් එක් පාසල්, දෙමළ මාධ්‍ය පාසල් සමග සම්බන්ධ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'11

ගරු අජිත් කුමාර මහතා,— පූර්ව ළමා විය අධ්‍යාපනය පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— අප රට තුළ දරුවන්ගේ අධ්‍යාපනයේ ඉතා වැදගත් අවස්ථාවක් වන පූර්ව ළමා විය අධ්‍යාපනය ලබා දීම (පෙර පාසල් අධ්‍යාපනය) පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර පෙර පාසල් පාලිකාවන්ට විධිමත් පුහුණුවක් හා බඳවා ගැනීමේ ක්‍රමයක් සමගින් වැටුප් ක්‍රමයක් ද සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'11

ගරු අජිත් කුමාර මහතා,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ නිබන්ධනයක් සකස් කිරීම,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වටිනා ස්ථාන සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් වටිනාකමක් ඇති නිබන්ධනයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.